**ලංකා ධීවර සංස්ථාවේ ගනුදෙනු පිළිබඳ වාර්තාව - 2024**

---

ලංකා ධීවර සංස්ථාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සංස්ථාවේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි වන පරිදි කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

එම පනතේ 38 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අදාළ මෙහෙයුම් අත්පොතේහි 6.6 ජේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2025 දෙසැම්බර් 15 දින වන විටත් 2022, 2023 හා 2024 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | විගණන විමසුමේ සඳහන් කරුණ කෙරෙහි එකඟ වන අතර, 2021 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන මේ වනවිට විගණන කටයුතු වලට ඉදිරිපත් කර ඇති අතර 2022 වර්ෂයේ සිට 2024 දක්වා කෙටුම්පත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වාර්තා පිළියෙල කිරීමේ කටයුතු සිදුකර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව නියමිත කාලසීමාව තුලදී මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

**2.2 වත්කම් හා වගකීම් වල පැවැත්ම**

සංස්ථාව විසින් අවසන් වරට පිළියෙල කර ඉදිරිපත් කරන ලද 2019 හා 2020 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වත්කම්, වගකීම්, ආදායම්, වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | 2019<br>රු. | 2020<br>රු. |
|---|---|---|
| ජංගම නොවන වත්කම් | 1,513,191,452 | 1,470,060,885 |
| ජංගම වත්කම් | 403,239,918 | 566,085,703 |
| මුළු වත්කම් | 1,916,431,370 | 2,036,146,588 |
| හිමිකම් | 203,149,703 | 34,701,398 |
| ජංගම නොවන වගකීම් | 718,549,156 | 893,451,537 |
| ජංගම වගකීම් | 994,732,511 | 1,107,993,652 |
| මුළු හිමිකම් හා වගකීම් | 1,916,431,370 | 2,036,146,588 |
| ආදායම් | 3,041,791,819 | 3,000,237,089 |
| වියදම් | (3,205,271,444) | (3,140,992,219) |
| බදු පසු ලාභය/(අලාභය) | (163,479,625) | (140,755,130) |

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

| | නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 15 වන වගන්තිය | සේවා යෝජකයා විසින් සෑම සේවකයකුගේ දායක මුදල එම සේවකයාගේ ඉපයීම්වලින් අඩුකොට ඊළඟ මාසයෙහි අවසාන දිනට පෙර සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු වුවද සංස්ථාව විසින් සේවක අර්ථසාධක අරමුදල් නියමිත දිනට නොගෙවීම හේතුවෙන් 2025 අගෝස්තු 31 දිනට සේවක අර්ථසාධක අරමුදල් හා එම අධිභාර වශයෙන් රු.700,641,706 ක් ගෙවීමට පැවතුණි. තවද සංස්ථාව විසින් 2024 වර්ෂයේදී සේවක අර්ථසාධක අධිභාර වියදම් ලෙස රු.23,671,197 ක් ගෙවා තිබුණි. | ආයතනයේ පවතින මූල්‍ය දුෂ්කරතාවයන් නිසා විගණනයේ දක්වා ඇති පරිදි නියමිත කාලවලදී මෙම අරමුදල් ගෙවීමට නොහැකි වූ අතර අර්ථසාධක අරමුදල් , නොගෙවූ පාරිතෝෂික දීමනා සහ හිඟ බදු මුදල් පියවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් අමතර ප්‍රතිපාදන ලබා දෙන ලෙස ලේකම්තුමා මඟින් දැනටමත් ඉල්ලීම් සිදු කර ඇත. | සේවක අර්ථසාධක අරමුදල් පනත අනුව නිසි පරිදි කළට වේලාවට දායක මුදල් ගෙවිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ ii වන කොටසේ (5) (1) උපවගන්තිය. | පාරිතෝෂික අරමුදල් සඳහා හිමිකම් ලබන යම් සේවකයකු ඉවත් වීමේදී දින 30 ක් ඇතුළත එම හිමිකම් ලබන පාරිතෝෂික මුදල් ගෙවිය යුතු වුවද සංස්ථාව ඒ අනුව ගෙවීම් නොකිරීම හේතුවෙන් 2025 අගෝස්තු 31 දිනට ගෙවිය යුතු පාරිතෝෂික දීමනා ශේෂය රු.20,674,616 ක් සහ එහි අධිභාරය රු.6,354,424 ක් වී තිබුණි. මේ සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුව මඟින් කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ 84364/5/23 යටතේ නඩුවක් ද ගොනුකර තිබුණි. | මහා භාණ්ඩාගාරයෙන් අමතර ප්‍රතිපාදන මුදල් ලද විගස මෙම ගෙවීම් සිදු කිරීමට බලාපොරොත්තු වේ. | පාරිතෝෂිත මුදල් ගෙවීම් පනත අනුව ගෙවිය යුතු පාරිතෝෂිත මුදල් ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ (සංශෝධිත) 26 වන වගන්තිය | යම් බදු අය කළ හැකි කාලසීමාවක් සම්බන්ධයෙන් වූ බද්ද එම බදු අය කළ හැකි කාලසීමාව අවසාන වීමෙන් පසුව ඊලඟ මාසයේ 20 වන දිනට පෙර ගෙවිය යුතු වුවත් 2025 මැයි 31 දිනට නොගෙවූ එකතු කළ අගය මත බදු බැදියාව රු. 19,696,372 ක් විය. | ආයතනයේ පවතින මූල්‍ය දුෂ්කරතාවයන් හේතුවෙන් නිසි කළට වේලාවට බදු බැදියාව ප්‍රේෂණය කළ නොහැකි වූ අතර මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබා දෙන ලෙස ඉල්ලීම් සිදුකොට ඇත. මෙම අමතර ප්‍රතිපාදන ලද විගස මෙම ගෙවීම් සිදු කිරීමට බලාපොරොත්තු වේ. | එකතු කළ අගය මත බදු පනත අනුව එකතු කළ අගය මත බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 4 වගන්තිය | ජාතිය ගොඩනැගීමේ බදු අදාළ කාර්තුව අවසන් වූ පසුව ඊලඟ මාසයේ 20 වන දින හෝ ඊට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු වුවද, 2025 මැයි 31 දිනට නොගෙවූ එම බදු බැදියාව රු.85,169,312 ක් විය. | ආයතනයේ පවතින මූල්‍ය දුෂ්කරතාවයන් හේතුවෙන් නිසි කළට වේලාවට බදු බැදියාව ප්‍රේෂණය කළ නොහැකි වූ අතර මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබා දෙන ලෙස ඉල්ලීම් සිදුකොට ඇත. මෙම අමතර ප්‍රතිපාදන ලද විගස මෙම ගෙවීම් සිදු කිරීමට බලාපොරොත්තු වේ. | ජාතිය ගොඩනැගීමේ බදු පනත අනුව ජාතිය ගොඩනැගීමේ බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 18 (4) වගන්තිය | අස්ථිත්වයක් විසින් විගණන ගාස්තු සඳහා වූ ඉන්වොයිස් පත්‍රයේ දින සිට දින 30 ඇතුළත ගෙවා බේරුම් කළ යුතු නමුත් 2013 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා සංස්ථාව විසින් ගෙවිය යුතු විගණන ගාස්තුව රු.7,344,660 ක් විය. | ආයතනයේ පවතින මූල්‍ය දුෂ්කරතාවයන් නිසා විගණන ගාස්තු නිසි කළට වේලාවට ගෙවීම් කිරීමට නොහැකි වූ අතර ඉදිරියේදී මෙම හිඟ විගණන ගාස්තු මූල්‍ය තත්වය යහපත් වූ විගස ගෙවා නිම කිරීමට කළමනාකාරිත්වය තීරණය කර ඇත. | ජාතික විගණන පනත ප්‍රකාරව විගණන ගාස්තු නියමිත දිනට ගෙවිය යුතුය. |
| (ඊ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| | (i) 4.2.1 ඡේදය | අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු නමුත් සංස්ථාව විසින් 2024 වර්ෂය ඇතුළත් කාලසීමාව සඳහා එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | විගණනයේ දක්වා ඇති පරිදි ඉදිරියේදී අවධානය යොමු කොට ඒ අනුව කටයුතු කිරීමට කළමනාකාරිත්වය තීරණය කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුය. |
| | (ii) 4.2.2 ඡේදය | සංස්ථාව විසින් 2024 වර්ෂය සඳහා එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාලක්‍රමානුගතව විස්තර කරන ප්‍රසම්පාදන කාලසටහන පිළියෙල කර නොතිබුණි. | විගණනයේ දක්වා ඇති පරිදි ඉදිරියේදී අවධානය යොමු කොට ඒ අනුව කටයුතු කිරීමට කළමනාකාරිත්වය තීරණය කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කළ යුතුය. |
| (උ) | 2017 ජුනි 28 දිනැති අංක 01/2017 වත්කම් කළමනාකරණ චක්‍රලේඛය. | මූල්‍ය නොවන වත්කම් ලේඛනගත කිරීම සම්බන්ධයෙන් 2024 වර්ෂයට අදාළව, කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත වාර්තා කර නොතිබුණි | ඉදිරියේදී අදාල වාර්තා කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. | වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව වත්කම් ලේඛනගත කර වාර්තා කළ යුතුය. |
| (ඌ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ සඳහන් මෙහෙයුම් අත්පොතේ 6.6 ඡේදය | මූල්‍ය වර්ෂය අවසන් වී මාස 05 ක් ඇතුළත සංස්ථාවේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද, 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වර්ෂයන්ට අදාළ වාර්ෂික වාර්තා 2025 ජුනි 25 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව කැබිනට් අනුමැතිය සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති අතර 2020 වාර්ෂික වාර්තාව සකස් කරමින් පවතී. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොත ප්‍රකාරව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත සිදු කළ යුතුය. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 නොවැම්බර් මස 25 දින පවත්වන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී සංස්ථාව වෙත ලබා දී තිබුණු පහත නිර්දේශ සම්බන්ධයෙන් සංස්ථාව ක්‍රියා කර නොතිබුණි. | | |
| (i) | ණය ශේෂ අයකර ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස්කර ණය අයකර ගැනීමේ කටයුතු පසුවිපරම් කරන ලෙසත් ,එහි ප්‍රගතිය සති 3ක් ඇතුලත වාර්තා කරන ලෙසත් කමිටුව විසින් ගණන්දීමේ නිලධාරීට නිර්දේශ කර තිබුණි. | දූර්වල මට්ටමේ පැවති ණය අයකර ගැනීම සඳහා පොලිස් පැමිණිලි සහ නීතිමය කටයුතු සිදුකර ඇත. ඒ අනුව මේ වනවිට පැරණි ණයගැති ශේෂ අයකර ගනිමින් පවතී.ධීවර අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් ව්‍යාපාර සම්පත් සැළසුම්කරණ පද්ධතියක් (Enterprise Resource Planning - ERP ) අප ආයතනයට දීමට කටයුතු දැනටමත් සකස් කරමින් පවතින අතර මේ වනවිට පෙරහුරු වැඩසටහන් ක්‍රියාත්මක වෙමින් පවතී. | අයකර ගත යුතු ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් ක්‍රමවේදයක් සකස් කර කඩිනමින් ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | සේවක භාරකාර අරමුදලේ දායක මුදල් හා සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් මාසිකව හෝ වාර්ෂිකව ගෙවන ලෙස හා හිඟ දායක මුදල් ශේෂය ගෙවීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ හැකි හා ප්‍රායෝගික ක්‍රමවේදයක් සකස් කර සති 2 ක් තුල කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ගණන්දීමේ නිලධාරීට නිර්දේශ කරන ලදි. | මේ වනවිට 2025 ජුනි, ජූලි, අගෝස්තු මාසවලට අදාල සේ.අ.අ. ගෙවා නිමකර ඇති අතර මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර ඇති ප්‍රතිපාදන මුදල් ලද වහාම මෙම හිඟ හිටි ශේෂයන් ගෙවීමට අපේක්ෂිතය. 2025 මැයි මස 31 දිනට ගෙවිය යුතු රු.3,078,575 ක මුදල ( සේවක භාරකාර අරමුදලේ දායක මුදල් හා අධිභාරය ) මේ වනවිට ගෙවා අවසන් වේ. | හිඟ දායක මුදල් ගෙවීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ හැකි ප්‍රායෝගික ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කළයුතු අතර සේවක අර්ථසාධක අරමුදලේ 2025 අගෝස්තු 31 දිනට හිඟව පවතින රු.700,641,706 ක් දායක මුදල් ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සංස්ථාවේ එක් එක් විධායකය විසින් මසුන් මිලදී ගෙන විකිණීම සඳහා එම එක් එක් විධායකවලට අයත් වෙළඳසැල්වලට නිකුත් කරන අතර | 2024.12.31 දිනට පවතින අභ්‍යන්තර, බාහිර හා රෝහල් යන ණයගැති ශේෂයන්ගෙන් රෝහල් ණයගැති ශේෂය නොකඩවා අය | මසුන් විකිණීමෙන් මෙන් ලද මුදල් වෙළඳසැල් භාරකරුවන් විසින් |

| | | | |
|---|---|---|---|
| | එම වෙළඳසැල් විසින් මසුන් විකිණීමෙන් ලැබෙන මුදල් අදාළ විධායකය වෙත ප්‍රේෂණය කළ යුතු වේ. එසේ වුවද අදාළ වෙළඳසැල් භාරකරුවන් විසින් එම මුදල් නිසි පරිදි ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් විධායකයන් 17 කට අදාළව 2024 දෙසැම්බර් 31 දිනට සංස්ථාව වෙත ලැබිය යුතු වටිනාකම රු.36,208,268 ක් වී තිබුණි. | කර ගෙන යන බව දන්වමි. | සිය පෞද්ගලික ප්‍රයෝජනය වෙනුවෙන් පරිහරණය කිරීම වැළැක්විය යුතු අතර එම මුදල් කඩිනමින් හිඟ හිටි ඇති වෙළෙඳසැල් භාරකරුවන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමටත්, එම මුදල් ප්‍රේෂණය කර ගැනීම විධිමත් වැඩපිළිවෙලක් කඩිනමින් ස්ථාපිත කිරීමටත් කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | රෝහල් විසින් ඇණවුම් කළ කෙළවල්ලන් මාළු වෙනුවට එකඟතාවයකින් තොරව ලින්නන් හා තෝර මාළු ලබාදීම වෙනුවෙන් රෝහල් 25 ක් වෙතින් 2024 දෙසැම්බර් 31 දිනට අයනොවූ රු.2,494,656 ක් වූ ශේෂය වර්ෂ පහකට වඩා පැරණි ණය ශේෂයක් විය. | රෝහල් සැපයුම ආරම්භ කළ දා සිට පැවත එන අක්‍රීය තත්වයට පත්ව ඇති ණයගැති ශේෂ අයකර ගැනීම සඳහා සංස්ථාව විසින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මුදල්ගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත්කර ඇත. | පැරණි ශේෂයන් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2024 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ ලැබිය යුතු දෑ තුළ රු. 137,859,301 ක අක්‍රිය ණය ශේෂයක් අතුළත් වූ අතර එයින් වර්ෂ 05 ඉක්ම වූ ශේෂය රු.91,824,450 ක් ද වර්ෂ 10 ඉක්මවූ ශේෂය රු.34,154,417 ක් විය.ඒ අනුව වසර ගණනාවක් පවතින මෙම ශේෂ අයකර ගැනීමට සංස්ථාව ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සේවය හැරගොස් ඇති සේවක මහතුන් වෙනුවෙන් නීති අංශය හරහා අවශ්‍ය නිත්‍යානුකූලව කටයුතු කරගෙන යනු ලැබේ. බාහිර ණයගැති ශේෂ අයකර ගැනීම සඳහා නීති අංශය විසින් එන්තරවාසි යැවීමට දැනටමත් ආරම්භ කර ඇත. | 2024 දෙසැම්බර් 31 දිනට පවතින රු.137,859,301 ක් වූ අක්‍රීය ණය ශේෂයන් කඩිනමින් අය කර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ගයන් ගත යුතුය. |
| (ඉ) | 2024 දෙසැම්බර් 31 දිනට මත්ස්‍ය මිලට ගැනුම් වෙනුවෙන් බාහිර පාර්ශවයන් වෙත රු.607,536,937.23 ක ගෙවිය යුතු ශේෂයක් වූ අතර මෙම ශේෂය තුල වර්ෂ දෙකට වඩා වැඩි ශේෂය රු.162,015,002 ක් විය. ඒ අනුව මෙම ණය හිමි ශේෂ පියවීම සම්බන්ධයෙන් සංස්ථාව අවධානය යොමු කර නොතිබුණි. | සංස්ථාවේ මූල්‍ය තත්වය යහපත් වූ පසු වසර 02ට වඩා වැඩි කාල පරාසයක් ගතවී ඇති ශේෂවල මුදල් ගෙවීමට කටයුතු කරන බව සඳහන් කරමි. | ශේෂයන් කඩිනමින් පියවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 2025 මාර්තු 31 දිනට ලංකා බැංකු ණය ශේෂය රු.158,623,208 ක්ද එදිනට ගෙවිය යුතු පොලී ශේෂය රු.98,005,988 ක් හා එදිනට බැංකු අයිරා ශේෂය රු.82,279,516 ක්ද විය. බැංකු ණය සඳහා භාණ්ඩාගාරය ඇප වී තිබුණු අතර බැංකු අයිරා පහසුකම් දෙකක් වෙනුවෙන් ශීතකරණ සහිත ලොරි රථ 44 ක් හා ඇතුල්කෝට්ටේ හා කුරුණෑගල ගැට්ටුවාන පිහිටි ඉඩම් 2 ක් ඇප ලෙස තබා තිබුණි. නමුත් මෙම බැංකු ණය හා අයිරා ශේෂය නියමිත පරිදි නොගෙවීම හේතුවෙන් හිඟව පැවතුණි. | ආයතනයේ පැවති මූල්‍ය දුෂ්කරතාවය හේතුවෙන් මෙම බැංකු ණය මුදල් ගෙවීමට නොහැකි වූ අතර මේ සම්බන්ධයෙන් ලංකා බැංකු කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා කිරීමට කටයුතු සිදුකරමින් පවතී. දැනටමත් මේ සම්බන්ධව ඉල්ලීම් ලිපියක් ධීවර නියෝජ්‍ය අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කර ඇත. | බැංකු ණය ශේෂයන් කඩිනමින් පියවීමට කටයුතු කළ යුතුය. |
| (උ) | 2015 දී ගාල්ල අයිස් යන්ත්‍රාගාරයේ සම්පීඩක යන්ත්‍ර අමතර කොටස් අස්ථානගත වීම සම්බන්ධයෙන් 2025 මැයි 31 වන විටත් මු.ර.103(ඇ) අනුව වගකිව යුත්තන් නිශ්චය කර අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර වර්ෂ හතකට පසු එනම් 2022 මාර්තු 15 දින පොලිසියට පැමිණිල්ලක් කර තිබුණි. | පොලිසිය විසින් නඩු අංක 01150 යටතේ ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් පවරා ඇත. | මු.ර103 (ඇ) ප්‍රකාරව පරීක්ෂණ පවත්වා මෙම අලාභයට වගකිව යුතු පාර්ශවයන් නිශ්චය කළ යුතුය. |
| (ඌ) | 2002 සැප්තැම්බර් 16 දින පැවති 847 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ තීරණය අනුව සේවක හිඟ ණය මාස 3 ක් ඇතුළත අදාල සේවකයින්ගෙන් අයකර ගැනීමටත් ණය මුදල් නොගෙවන සේවකයින්ගේ සේවය අත්හිටුවීමට තීරණය කර තිබුණ ද එය ක්‍රියාත්මක කර නොතිබූ අතර 2024 දෙසැම්බර් 31 වන විට ලැබිය යුතු සේවක ණය වටිනාකම රු. 60,537,636 ක් විය. | සේවක ණයගැති ශේෂයන් අයකර ගැනීම සඳහා දැනටමත් ඇතැම් සේවකයන්ගේ සේවය අවසන් කොට නීත්‍යානුකූලව ක්‍රියාමාර්ග ගෙන ඇත. | සංස්ථාවේ සේවකයින්ගෙන් අයවීමට ඇති ණය ශේෂයන් අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2025 මැයි 30 දිනට සංස්ථාව සතුව පවතින ශීතාගාර 10 න් වර්තමානයේ ශීතාගාර 06 ක් පමණක් ක්‍රියාකාරී තත්ත්වයේ පැවතුනි. තව ද සංස්ථාව සතුව පවතින ශීත බහාලුම් (කන්ටේනර් පෙට්ටි) 14 න් මෙට්‍රික්ටොන් 05 කින් යුත් ප්‍රධාන කාර්යාලය සතු ශීත බහාලුම් 7 ක් පමණක් 2025 මැයි 30 දිනට ක්‍රියාකාරී | ශීතාගාර ඉතා පැරණි ඒවා වේ. එම ශීතාගාර අළුත්වැඩියා කිරීමද ඉතා අපහසු වන අතර බහාලුම් පෙට්ටිද දිරාගොස් ඇත. තවද මෙම ශීතාගාරවල උෂ්ණත්වය සෙල්සියස් අංශක -20 ($-20^{\circ}$ C) අඩු කිරීමට අපහසුය. සාමාන්‍යයෙන් අප විසින් අළුත්වැඩියා කරන ලද ශීතාගාර | අක්‍රිය තත්ත්වයේ පවතින ශීතාගාර නිසි ක්‍රමවේදයක් තුල නඩත්තු කර භාවිතයට ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තත්ත්වයේ පැවතුනි. අක්‍රිය තත්ත්වයේ පවතින ශීතාගාර නඩත්තු නොකිරීම හේතුවෙන් පෞද්ගලික සැපයුම්කරුවන් වෙතින් ශීත බහාලුම් හා ශීතාගාර කුලියට ලබා ගැනීම වෙනුවෙන් 2020 වර්ෂයේ සිට 2025 මැයි 31 දක්වා සංස්ථාව විසින් රු. 29,841,599 ක් වැය කර තිබුණි. | උපරිම වශයෙන් සෙල්සියස් අංශක -7 ත් -8ත් අතර පවතී. එබැවින් මසුන් ගබඩා කර නියමිත ප්‍රමිතියට පවත්වා ගැනීමට බාහිරින් ශීතාගාර කුලියට ගැනීමට සිදු වී ඇත. සෙල්සියස් අංශක -20 මෙ.ටො.200 ශීතාගාරයක් හා සෙල්සියස් අංශක - 20 මෙ.ටො.2.5ක අධිශීතාගාරයක් සංස්ථාව තුල ස්ථාපිත කිරීමට ධීවර අමාත්‍යාංශයෙන් රු.මිලියන 86 ක ප්‍රතිපාදන වෙන්කිරීම් සිදුකර ඇත. | |
| (ආ) | මත්ස්‍ය පිරිසැකසුම් ඒකකයක් ඉදි කිරීම සඳහා 2017 වර්ෂයේ රජයේ ප්‍රදාන ලෙස ලැබී තිබුණු රු. 65,000,000 න් රු. 36,869,598 ක් ආයතනයේ වියදම් සඳහා වැය කර තිබුණි. ඉතිරි රු.28,130,402 ප්‍රධාන කාර්යාලය පරිශ්‍රයේ මත්ස්‍ය පිරිසැකසුම් ඒකකය ඉදි කිරීම සඳහා වැය කර තිබුණද පසුව එය අතහැර දමා ඇති අතර වර්තමානය වන විට එය විනාශ වෙමින් පැවතීම හේතුවෙන් එම වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | විගණනයේ සඳහන් කරුණු කෙරෙහි එකඟ වන අතර මෙම කරුණු කළමනාකාරිත්වය වෙත යොමුකර අවශ්‍ය උපදෙස් අනුව ඉදිරියේදී කටයුතු කරමි. | අදාළ වත්කම් සම්බන්ධයෙන් නැවත සමාලෝචනයක් සිදු කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර ඒ සඳහා උචිත පියවර ගත යුතුය. |
| (ඇ) | ටින්මසුන් කර්මාන්ත ශාලාවක් ඇරඹීමේ පරමාර්ථයෙන් රුසියානු සමාගමක් සමඟ 2003 වසරේ ඇතිකරගත් බද්ධ ව්‍යාපාරය සඳහා සංස්ථා දායකත්වය ලෙස ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ පිහිටි අක්කර 01 ½ කින් යුත් ඉඩමක් රු.110,000,000ක වටිනාකමට විකුණුම්කර ඔප්පුවකින් පුද්ගලික සමාගමක කොටස් 1,100,000 ක් ලෙස ආයෝජනය කර තිබුණි.මේ දක්වා ටින් මසුන් කර්මාන්තශාලාවක් ආරම්භ කර නොතිබූ අතර සංස්ථාව විසින් සමාගම වෙත පැවරූ ඉඩම නීත්‍යානුකූලව නැවත සංස්ථාව වෙත පවරා ගැනීම සඳහා කොළඹ දිසා අධිකරණයේ නඩුවක් පවරා තිබුණි. | කොළඹ දිසා අධිකරණයේ ගොනුකරන ලද අංක අංක DLM 15/2018 දරන නඩුව 2025.10.29 දින කරුණු තහවුරු කර ගැනීම සඳහා කැඳවන ලදී. 2025.12.17 දිනට මෝසමක් ඉදිරිපත් කර නැවත කරුණු තහවුරු කර ගැනීම සඳහා කැඳවීමට නියමිතව ඇත. | අධිකරණ නියෝගය අනුව ඉදිරි කටයුතු සිදු කළ යුතුය. |
| (ඇ) | ත්‍රිකුණාමල මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ මත්ස්‍ය ලැලි 46 ක් බාහිර පාර්ශවයන් වෙත කුලියට ලබා දී තිබූ අතර 2025 අප්‍රේල් 30 දින වන විට බාහිර පාර්ශවයන් වෙතින් අයවිය යුතු කුලී මුදල රු.6,333,695 ක් ද, 2024 | ත්‍රිකුණාමල මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ අයවීමට පවතින හිඟ ලැලි සහ අයවිය යුතු දඩ පොළී මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු මේ වනවිට නීති අංශය මඟින් සිදුකරමින් පවතින අතර | අයවිය යුතු කුලී මුදල අයකර ගැනීමටත් ගෙවිය යුතු හිඟ කුලිය පියවීමටත් කටයුතු යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සැප්තැම්බර් 30 දින වන විට ඉහත හිඟ කුලී සඳහා අයවිය යුතු දඩ පොළිය රු.46,619,571 ක් ද විය. එසේම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය ඉදිකර ඇති ඉඩම ත්‍රිකුණාමලය නගර සභාවට අයත් බැවින් ශුද්ධ ආදායමෙන් සියයට 30 ක් ත්‍රිකුණාමලය නගර සභාව වෙත ගෙවීම් කළ යුතු වුවද 2014 සිට 2023 වර්ෂ දක්වා රු.2,001,900 ක් නගර සභාවට ගෙවීමට පැවතුනි. | ත්‍රිකුණාමල නගර සභාවට ගෙවීමට තිබූ වටිනාකමින් රු.200,000/-ක් ගෙවීම් කර ඇත. ඒ අනුව තවදුරටත් රු.1,801,900.00ක් නගර සභාව වෙත ගෙවීමට පවතී. | |
| (ඉ) | වෙළඳසැල් ආරම්භ කිරීමට මත්තෙන් අදාළ ප්‍රදේශයේ මාළු අලෙවිය පිළිබඳ වෙළඳපල සමීක්ෂණයක් සිදු නොකර වෙළඳසැල් ආරම්භ කිරීම හේතුවෙන් 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ආරම්භ කරන ලද වෙළඳසැල් වලට සාපේක්ෂව සියයට 75 ක් පමණ වසා දැමීමට සිදුවී තිබුණි. | වෙළඳසැල් ආරම්භ කර පවත්වාගෙන යාමේදී පෞද්ගලික වෙළඳසැල් ඒ ආසන්නයේ ආරම්භ කර තත්වයෙන් බාල මසුන් අඩු මිලට අලෙවි කිරීම නිසා සංස්ථා අලෙවිසැල්වල මසුන් අලෙවිය පහත වැටීම මෙන්ම අදාල ප්‍රදේශයේ පලාත් පාලන ආයතන විසින් වෙළඳසැල වසා දැමීමට නියෝග නිකුත් කිරීමද ප්‍රධාන ගැටළුවක් වී ඇත. මේ සඳහා නව සම්මත ක්‍රියාවලිය ඇතුලත් වාර්තාවක් සකස්කර එය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදුන් පසු මින් ඉදිරියට වෙළඳසැල් ආරම්භ කිරීමේදී එම ක්‍රියාවලිය අනුගමනය කිරීමට නියමිතය | වෙළඳපල සමීක්ෂණයන් සිදු කර ඒ අනුව අළුතින් වෙළඳසැල් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.3 නිෂ්කාර්ය හා ඌණ උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2025 මැයි 30 දිනට සකස් කරන ලද වාහන උපලේඛණය අනුව ධාවන තත්ත්වයේ නොපවතින වාහන 22 ක්ද ,අපහරණය කිරීමට නියමිත වාහන 17 ක් ද සහ තොරතුරු සපයා ගත නොහැකි වාහන 16 ක්ද පැවතුණි. | ධීවර අමාත්‍යාංශයේ නියෝජිතයෙකු මිල ලංසු ඇගයීමේ කමිටුවට පත්කර ගැනීම සඳහා ලිඛිත ඉල්ලීමක් අමාත්‍යාංශය වෙත යවා ඇත. අමාත්‍යාංශ නියෝජිතයෙකු පත්වූ වහාම මෙම ක්‍රියාවලිය සිදු කිරීමට බලාපොරොත්තු වේ. | අපහරණය කිරීමට නියමිත වාහන කඩිනමින් අපහරණය සිදු කළ යුතු අතර ධාවන තත්ත්වයේ නොපවතින වාහන සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතුය. තවද තොරතුරු නොමැති වාහන සම්බන්ධයෙන් කඩිනමින් |

| | | | |
|---|---|---|---|
| | | | විගණනය සඳහා තොරතුරු ලබාදිය යුතුය. |
| (ආ) | ආයතනයේ ප්‍රධාන කාර්යාලයේ පවතින ඩීසල් පිරවුම්හල මේ වන විට ක්‍රියාත්මක නොවන අතර එහි අවසන් වරට ලංකා ඛනිජ තෙල් සංස්ථාවෙන් ඩීසල් මිලදී ගෙන ඇත්තේ 2023 ජූලි 13 දින වන අතර එහි තෙල් නිකුත් කිරීමේ කටයුතු 2023 සැප්තැම්බර් 08 වන දින නවතා ඇති අතර ඩීසල් පිරවුම්හල මේ වන විට දිරා පත් වෙමින් පැවතුණි. | නැවත ප්‍රධාන කාර්යාලය තුල ඩීසල් පිරවුම්හල ක්‍රියාත්මක කිරීම සඳහා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව වෙත මෙම පිරවුම්හලේ තත්ව පරීක්ෂාවක් සිදුකර දෙන ලෙස ඉල්ලීමක් සිදුකරමින් ලිපියක් යොමුකළ අතර ඒ අනුව නිලධාරියෙකු පැමිණ ඉන්ධන ටැංකිය පරීක්ෂා කර බලා ඒ සම්බන්ධයෙන් තත්ව පරීක්ෂණ වාර්තාවක් ලබා ගැනීමට අදාල බාහිර සැපයුම්කරුවෙකුගේ නමක් අප වෙත ලබා දී ඇත. ඒ අනුව කඩිනමින් මෙම සැපයුම්කරුගෙන් තත්ව පරීක්ෂණ වාර්තාවක් ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කිරීමට බලාපොරොත්තු වේ. | ඩීසල් පිරවුම්හල නැවත ක්‍රියාත්ම කිරීම කඩිනමින් සිදු කළ යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2025 ජුනි 30 දිනට අනුමත කාර්ය මණ්ඩලයට අනුව මෙහෙයුම් ක්‍රියාවලිය සහ එහි කාර්ය සාධනය සම්බන්ධයෙන් කටයුතු කරන සංස්ථාවේ කාර්ය මණ්ඩලයේ ප්‍රධාන තනතුරක් වන සාමාන්‍යාධිකාරී තනතුර සහ සංස්ථාවේ මෙහෙයුම් සහ අනිකුත් කටයුතු ඉටුකිරීමට අත්‍යවශ්‍ය ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 15 ක නිලධාරීන් 25 කගේ පුරප්පාඩු පවතින අතර ඉන් තනතුරු 13 ක පුරප්පාඩු 2019 වර්ෂයේ සිට සම්පූර්ණ කිරීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි. | තනතුරු 31 සම්බන්ධයෙන් රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්යය මණ්ඩලය කළමනාකරණය කිරීමට අදාලව අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් අනුමැතිය සඳහා යොමුකළ අතර තනතුරු 30ක් සඳහා අනුමැතිය ලැබී ඇත. ඒ අතරින් තනතුරු 08ක් සඳහා පමණක් පුවත්පත් දැන්වීම් පළ කර අදාල බඳවාගැනීම් සිදුකිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති අතර අනෙකුත් තනතුරු සඳහා බඳවා ගැනීම් කටයුතු සිදු කිරීමට නියමිතව පවතී. | අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. |
| (ආ) | 2025 ජුනි 30 දිනට අනුමත කාර්ය මණ්ඩලයෙහි අන්තර්ගත, දරන්නාට පෞද්ගලික වන තනතුරු 7 ක සේවකයින් 63 ක් හැර සංස්ථාවේ තෘතීයික මට්ටම තනතුරු 16 ක සේවක පුරප්පාඩු 36 ක්, ද්විතීක මට්ටම තනතුරු 6 ක අතිරික්ත සේවකයින් 25 ක් සහ තනතුරු 12 ක සේවක පුරප්පාඩු 72 විය. තවද ප්‍රාථමික මට්ටම තනතුරු 3 ක | අනුමත කාර්ය මණ්ඩලය 724 බවට සංශෝධනය විය යුතු බව සඳහන් කර ඇතත් මේ වනතෙක් අනුමත කාර්ය මණ්ඩලය 660 යනුවෙන් විටින් විට සඳහන් කර ඇති බැවින් අනුමත සංඛ්‍යාව 724 ලෙස සංශෝධනය විය යුතුය.<br>සත්‍ය කාර්ය මණ්ඩලය ඉහත පරිදි 557ක් ලෙස සංශෝධනය විය යුතු අතර ඊට අදාලව පුරප්පාඩු | කාර්ය මණ්ඩලය වර්තමාන තත්ත්වයට ගැලපෙන පරිදි සංශෝධනය කර පුරප්පාඩු පිරවීමටත් , අතිරික්ත තනතුරු සම්බන්ධයෙන් අනුමැතීන් ලබා ගැනීමටත් කටයුතු |

| | | |
|---|---|---|
| සේවකයින් 30 ක අතිරික්තයක් ද, තනතුරු 12 ක සේවකයින් 51 ක පුරප්පාඩු ද පැවතුනි. | සංඛ්‍යාවද 167ක් ලෙස සංශෝධනය විය යුතු බව දන්වන අතර තනතුරු නාම අනුව අතිරික්ත පුරප්පාඩු සංඛ්‍යාව වෙනස් වේ. | කළ යුතුය. |